# ශ්‍රීලංකාවේ අක්ෂර කලාවේ ආරම්භය පිළිබඳ සමාලෝචනයක්

එස්. එම්. හෙට්ටිආරච්චි[1], කේ.කේ.පී.එම්. ජයතිලක[2], ජේ.ඒ.අයි. සංදීපනී[3], ඒ.කේ.එස්. ජයතිස්ස[4]

පුරාවිද්‍යා අධ්‍යනාංශය,කැලණිය විශ්වවිද්‍යාලය

[1]sachinihetti25@gmail.com,[2]madarajayathilake@gmail.com,[3]isharajayaweera84@gmail.com

[4]aksjayatissa@gmail.com

ප්‍රමුඛ පද: අක්ෂර කලාවේ ආරම්භය, ප්‍රාග් මහින්ද යුගය, සෙල්ලිපි, පුරාවිද්‍යාත්මක සාධක, සාහිත්‍ය මූලාශ්‍රය, අක්ෂර විද්‍යාව

## හැඳින්වීම

වානරයෙකුව සිට මානවයෙකු දක්වා ගමන් කල පරිණාමීය මාවතේ මිනිසා විසින් ලබා ගත් එක් වැදගත් ජයග්‍රහණයක් වුයේ භාෂාවක් නිපදවා ගැනීමත් එමගින් සැමට සන්නිවේදනය කළ හැකි අක්ෂර පද්ධතියක් බිහිකර ගැනීමත්ය. අක්ෂර පද්ධතියක් බිහිකර ගැනීමට ප්‍රථම මානවයින් විසින් තමා අදහස් හුවමාරු කර ගනු ලැබුවේ විවිධ වූ ශබ්ද,අංග චලන වැනි ප්‍රාථමික සන්නිවේදන ක්‍රම වේදයන් තුළිනි. පසු කාලීනව නොයෙකුත් රූප සටහන් ඇදීමෙන් අවට පරිසරය පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීම සිදු කළ අතර එහි දියුණු අවස්තාවක් සේ අක්ෂර කලාවේ ආරම්භය හඳුන්වා දිය හැකිය. දැනට පවතිනා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් මත ලෝකයේ අක්ෂර කලාවේ ආරම්භක අවස්ථාව ලෙස මෙසපොතේමියානු අක්ෂර පෙන්වාදිය හැකිය. පසු කාලීනව විවිධ ශිෂ්ටාචාරයන් බිහිවීමත් සමඟ ඔවුනට ආවේනික වූ අක්ෂර පද්ධතියක් බිහිකරගනු දැකිය හැකිය.මෙසේ ලෝකයේ අක්ෂර කලාවේ ආරම්භය සිදුවූ සේම ලංකාව තුළමිනිසුන් ශිෂ්ටාචාරගත වීමත් සමඟ ලංකාව තුළද අක්ෂර කලාවක් බිහිවන අතර අක්ෂර කලාවේ ප්‍රගමනය ක්‍රි.පූ අවදියේ සිට දැකගත හැකිය. ලාංකීය අක්ෂර කලාවේ ආරම්භය පිළිබඳව ප්‍රධාන වශයෙන්ම මතවාදයන් දෙකක් තිබේ. 1. (ක්‍රි.පූ.3 ට පෙර) මහින්දාගමනයට පෙර ප්‍රාග් මහින්ද අවධිය

2. (ක්‍රි.පූ.3 ට පසු) මහින්දාගමනයෙන් පසු වශයෙනි.

සාහිත්‍යමය මූලාශ්‍රයන් පදනම් කර ගනිමින් ලාංකීය අක්ෂර ආරම්භය මහින්දාගමනයට පසු සිදු වූ බව බොහෝ විද්වතුන්ගේ මතයයි.නමුත් පී.ඊ.පී. දැරණියගල, සිරාන් දැරණියගල, නන්දසේන මුදියන්සේ, යන විද්වතුන් විසින් සිදු කරනු ලැබූ පුරාවිද්‍යාත්මක හා අක්ෂර විද්‍යාත්මක, පර්යේෂණයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මහින්දාගමනයට ප්‍රථම මෙරට අක්ෂර කලාවක් වූ බවට තහවුරු කොටගෙන ඇත. මේ සමඟම මහින්දාගමනයට පසු අක්ෂර කලාවේ ආරම්භය සිදුවූ බවට වූ මතය හුදෙක් මතයක් ම පමණක් බවට පත් වී තිබේ. මෙම අධ්‍යනයේ දී බලාපොරොත්තු වනුයේ

- සාහිත්‍යමය
- පුරාවිද්‍යාත්මක
- අක්ෂර විද්‍යාත්මක

යන සාධක ත්‍රිත්වය කෙරෙහි අවධානය යොමු කරමින් ලාංකීය අක්ෂර කලාවේ ආරම්භය ක්‍රි.පූ.3 වැනි සියවසයේ මහින්දාගමනයත් සමඟ නොව මහින්දාගමනයට පෙර සිටම පැවති බව සාධනය කිරීමයි. එනම් මෙය සනාථ කිරීම උදෙසා ඉදිරිපත්කොට ඇති මතවාදයන්හි සත්‍යතාවය පරීක්ෂා කිරීම

තුළින් ලාංකීය අක්ෂර කලාවේ ආරම්භය ප්‍රාග් මහින්ද අවධියේ වූ බව පෙන්වාදීම මෙහි මුඛ්‍ය පරමාර්ථය වේ.

**ක්‍රමවේදය**

පර්යේෂණ ක්‍රමවේදය වශයෙන් සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය පරිශීලයනය කර තොරතුරු ලබා ගන්නා ලදී. ප්‍රධානතම සාහිත්‍ය මූලාශ්‍රය වශයෙන් යොදාගනු ලැබූවේ මහාවංසයයි. ඊට අමතරව පුරාවිද්‍යා පාලන වාර්තා, කැණීම් වාර්තා අධ්‍යයනය සිදුකරන ලදී. අවශ්‍ය ශිලාලේඛන අධ්‍යනය සඳහා ඒවා පිහිටුවා ඇති ප්‍රදේශ වෙත ගොස් තොරතුරු රැස් කිරීම සිදු කරන ලදී.

**ප්‍රතිඵල හා සාකච්ඡා**

ලාංකීය අක්ෂර කලාවේ ආරම්භය එකවර සිදු වූ සිදුවීමක් නොවන බව තහවුරු කිරීමට නිර්ණායක කිහිපයක්ම ඉදිරිපත් කළ හැකි ය.

• අක්ෂර මාලාවක් නිර්මාණය වීම කෙටි කාලයක් තුළ සිදු විය නොහැකි වීම

• අක්ෂර මාලාවක් ආරම්භව එය ව්‍යාප්තියට දීර්ඝ කාලයක් ගත වීම

යන කරුණු හේතුකර ගනිමින් විද්වතුන් මහින්දාගමනයට ප්‍රථම මෙරට අක්ෂර මාලාවක් බිහිවන්නට ඇති බව විශ්වාස කරනු ලැබේ. සාහිත්‍යමය, පුරාවිද්‍යාත්මක, අක්ෂර විද්‍යාත්මක සාධක අනුව මෙම මතය සාධනය කළ හැකිය.

**පුරාවිද්‍යාත්මක සාධක**

සිරාන් දැරණියගල මහතාගේ ප්‍රධානත්වයෙන් අනුරාධපුර ඇතුළු නුවර නැතහොත් සල්ගහවත්ත මහාපාලි දාන ශාලාව අසල කැණීමේදී (SW2) සොයාගන්න ලද පුරාවිද්‍යාත්මක සාධකයන් තුළින් ලංකාවේ අක්ෂර ක්‍රි.පූ.6 වැනි සියවසයට අයත් බව තහවුරු කර ඇත. මෙහිදී හමු වූ මැටි බඳුන් කොටසක පූර්ව බ්‍රාහ්මීය **ම ද** යන අක්ෂර හමුවන අතර අනෙකෙහි **බියා අනුරාධ** යන වචනය හමුවේ. තව දුරටත් මෙයට ආලෝකයක් සපයනු වස් දැරණියගල විසින් මහාවංශයේ සඳහන් වන්නා වූ කරුණක් ගෙන හැර දක්වනු ලබන්නේ ය. එනම් මහාවංස සාධක අනුව විජය රජු ලක්දිවට පැමිණෙන්නේ පිරිසක් සමග වන අතර ඔවුන් අතරින් පැමිණි අනුරාධ නම් පුද්ගලයා විසින් මල්වතු ඔය ආශ්‍රිතව අනුරාධග්‍රාමය පිහිට වූ බව සඳහන් වේ.මෙම කලනිර්ණය හා බලන කල ඔවුන් ලක්දිවට පැමිණියායැයි සැලකෙන කාලය හා සාපේක්ෂව ගත්කල ක්‍රි.පූ.6-5 ත් සියවස් අතර බව පෙන්වාදිය හැකිය. දැරණියගල හට තම මතය තහවුරු කිරීමට මෙය ප්‍රතිපෝෂකයක් වූ බව දැක්විය හැකි ය. ප්‍රාග් ඓතිහාසික ස්ථානයන්ගෙන් හමුවන්නා වූ සංකේතයන්ට සමාන අක්ෂර පසු කාලීන ව ලියවුණු ශිලාලේඛනයන් ගේ දක්නට ලැබීම ද මෙහි දී ඉදිරිපත් කළහැකි තවත් සාධකය කි. දොරවක කන්ද ආශ්‍රිතව හමුවන සංකේත මෙයට නිදසුන් වේ.



කන්දරෝදය හෙවත් කඳුරුගොඩ කරන ලද කැණීම තුළින් හමු වූ කාල රක්ත මැටි බඳුන් කොටසක **'දතහපත'** යනුවෙන් සඳහන් වී ඇත. ඉබ්බන්කට්ටුව ප්‍රාග් ඓතිහසික මෙගලිතික සුසාන භූමිය ආශ්‍රිතව සිදු කරන ලද පර්යේෂණවල්දී අක්ෂර කිහිපයක් සොයාගෙන ඇත. ක්‍රි.පූ.700-900 කාලයට කාල නිර්ණය කර ඇති මෙම සුසාන භූමියේ ව,බ අක්ෂර හමු වී ඇති අතර 8B බරණියේ **ශ** අක්ෂරය වේ. පොම්පරිප්පු, කොල්ලන්කනත්ත, කරෛනගර් ආදී ස්ථාන තුළින් සොයා ගන්නා ලද ක්‍රි.පූ.

| අශෝක අක්ෂර | ලංකාවේ සෙල්ලිපි |
|---|---|
| රජ | රඣ |

තුන්වැනි සියවසේ අක්ෂරවලට සමාන සංකේත සටහන් වෙයි.

**සාහිත්‍ය මූලාශ්‍රය සාධක**

මෙහි දි සාහිත්‍ය මූලාශ්‍රය ලෙස මහාවංසය භාවිතා කෙරේ.

1. විජය කුමරුට අභිෂේකය සඳහා සුදුසු මහේෂිකාවක් ගෙන්වා ගැනීමට මධුරා පුරයට දූතයින් යවන අවස්ථාවේ දී ඔවුන් අත හසුන් පත් යැවීම (මව.vii පරිච්ඡේදයඃ 50-52).
2. විජය සුමිත්ත කුමරුහට ලංකා රාජ්‍ය භාර ගැනීමට පැමිනෙන ලෙස ආරාධනා කර යවන ලද හසුන් පත (මව. viii පරි; 1-2).
3. ක්‍රි.පූ හතරවැනි සියවසේ දී පණ්ඩුල බමුණාගෙන් පණ්ඩුකාභය කුමරු ශිල්ප හැදැරූ බව (මව. xඃ 20-23)
4. අභය රජු ගඟින් එතෙර රජ කරන ලෙස දන්වා පණ්ඩුකාභයට යවන ලද හසුන් පත (මව. x පරිඃ 48-49)

**අක්ෂර විද්‍යාත්මක සාධක**

1. ක්‍රි.පූ. 3-1 කාලයට අයත් මෙරට බ්‍රාහ්මී ලිපිවල ඉන්දියානු අශෝක අක්ෂර අතර දැකගත නොහැකි අක්ෂර කිහිපයක් දැකගත හැකි වීම
උදාඃ- **ඉ , ම** යන අක්ෂර

2. අශෝක අක්ෂරයන් හි ඇති අල්පප්‍රාණ **ජ** අක්ෂරය වෙනුවට මෙරට දී එහි මහප්‍රාණය යොදා ගැනීම
උදාඃ-

3. ශිලා ලේඛන ලිවීමේ ක්‍රමවේද ඉන්දියානු ක්‍රමයෙන් වෙනස් වීම

- දකුණේ සිට වමට ලියන ලද ශිලා ලේඛන 32 ට වැඩි ප්‍රමාණයක් හමු වීම

උදාඃඃ- රස්නක වැව 116 ලිපිය, දූවේගල ලිපිය, දීවෙල 803 ලිපිය

- පළමු වැනි පෙළ දකුණේ සිට වමටත් දෙවැනි පෙළ වමේ සිට දකුණටත් ලියන ලද ශිලා ලේඛන හමු වීම

උදාඃ- සැස්සේරුව 1012 ලිපිය

- ලාංකීය ඇතැම් බ්‍රාහ්මී අක්ෂර අශෝක අක්ෂර හා නොගැලපීම

උදාඃ- **ච,ය,ත** වැනි අක්ෂර

ඉහත සඳහන් කරනු ලැබූ සියලුම සාධක තුළින් මෙරට අක්ෂර ලිවීම ආරම්භය ක්‍රි.පූ.6-5 සියවස් දක්වාම දිව යන බව තහවුරු වේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ප්‍රනාන්දු, පී.ඊ.පී. (1964). *සිංහල අක්ෂර මාලාවේ ආරම්භය.*කොළඹඃ සංස්කෘතික අමාත්‍යාංශය.

බිනරගම, ඩී. (2008). *ශ්‍රී ලංකාවේ ප්‍රාථමික චිත්‍ර කලාව හා ප්‍රාථමික ලේඛන කලාව.* ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.